# රුක්ඛ ධර්ම ජාතකය

තවද අසරණ සරණ වූ තිලෝගුරු බුදු රජානන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වසන සේක් දියදබරය නිසා තමන්ගේ නෑයන් මහත් වූ විනාසයට පැමිණෙන නියාව දැන ආකාශයෙන් ගොස් රෝහිනී නම් වූ ගංගා මස්තකයෙහි ආකාශයෙහි පලක් බැඳ වැඩ හිඳ නිල් රැස් විහිදුවා ඒකාන්ද කාර කොට නෑයන් බය ගන්වා ආකාශයෙන් බැස ගංතෙර වැඩ හිඳ ඒ කලබය අරඹයා මේ ජාතකය වදාල සේක.

මේ මෙහි සංශේපය විස්තර වූ කලි කුනාල ජාතකයෙහි මතු පහල වන්නේය. එසමයෙහි සර්වඥයන් වහන්සේ නෑයන්ට ආමන්ත්‍රණය කොට මහ රජ්ජුරුවෙනි තොප ඔවුනොවුන්ගේ නෑයෝය. නෑයන් විසින් සමගි සතුටුව වසන්ට වටනේයයි නෑයන්ගේ සමගී බවක් ඇති කල්හි පස මිතුරෝ අවකාශ නොලැබෙති. මනුෂ්‍යයන්ට තබා සිත් පිත් නැත්තා වූ වෘක්ෂයන්ගේ සමගි බව වන්නේයයි අතීතයෙහි හිමාලය වන ප්‍රදේශයෙහි මහ පවණෙත් සල් වනයෙකැ තරකොට හැමීය. ඒ සල්වනය ඔවුන් ඔවුන් හා මහරුස් පැලැටී ගස් කැලැ ලතා ආදීයෙන් වැළඳ ගත් බැවින් එක රුකකුත් එලවන්නට අසමර්ථව මුදුනෙන් මුදුනෙන්ම මහත් පවන් හමා ගියේය. ලතා ආදියෙන් වැලඳ ගැන්මක් නැතිව එළියෙහි සිටියා වූ අතු පතර වෙලෙත් ආදීයෙන් විශාල වූ එක් මහරුකක් සෙසු රුක් සේ ඒකාබද්ද නොවූ බැවින් ඒ රුක් මුලින් උදුරා එලාපුයේය. මේ කාරණයෙන් තොප හැම දෙනා විසිනුත් සමගි සතුටුව වසන්නට වටනේයයි වදාරා ඒ නෑයන් විසින් ආරාධිත වූ බුදුහු ඉකුත් වත් දක්වා වදාළසේක.

යටගිය දවස බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ්ජුරුකෙණෙකුන් රාජ්‍යය කරන කල්හි පළමු කොට උපන්නාවූ වෙසවුණු රජ්ජුරුවෝ චුත වූය. සක්‍ර දේවේන්ද්‍රයෝ අන් වෙසවුනු රජ කෙණෙකුන් නායකත්වයේ තිබූහ. ඒ වෙසවුණු රජ්ජුරුවන් ඉකුත් වූ කල්හි පසුව උපන් වෙසවුනු රජ්ජුරුවෝ මහරුක්ගස් කැලැ ලිය ආදීයෙන් අතුරෙන් තමන් කැමති කැමති තෙනක විමන් ගතිවයි කියා අසුන් යවූය. එසමයෙහි අප මහා බෝසතානෝ හිමාලය වන ප්‍රදේශයෙහි එක් සල්වනයක රුක්ෂ දේවතාව උපන්නාහ. බෝධිසත්වයෝ නෑයන්ට කියන්නාහු තෙපි හැම විමන් ගන්නා වූ එළියේ සිටි රුක්ෂ වල විමන් ගනුව තෙපි මේ සල් වනයෙහි මා විසින් ගන්නා ලද විමානය පිරිවරා විමන් ගනුවයි කීය. ඒ බෝධි සත්වයන් කීවා කරන්නාවූ නුවණැති දේවතාවෝ බෝධිසත්වයන්ගේ විමානය පිරිවරා වට සිටි සල් ගස් වල විමන් ගත්තාහුය. නුවණැත්තා වූ දේවතාවෝ අපට වනයෙහි විමානයෙන් ප්‍රයෝජන කිම්දැයි මනුෂ්‍යය පථයෙහි ගම් නියම් ගම් රාජධානි වල විමන් ගනුම්හයි ගම්ආදී නිසා වසන්නාවූ දේවතාවෝ ලාභයෙන් හා යසසින් අග්‍ර බවට පැමිණෙති යි කියා මනුෂ්‍ය පථයෙහි හිඳ මග එළිවල අටගත්තාවූ මහ රුක් වල විමන් ගත්තාහුය. ඉක්බිත්තෙන් එක් දවසක් මහත් වූ වැසි සුලගෙක් උපන්නේය. පවන් ඉතා තද බැවින් ගැඹුරට මහ මුල් ඇතිවනස් පටි වෘක්ෂයෝ බිඳී සිඳී ගිය අතු හා වෙලෙක් ඇතිව මුලින් උපුටා වැටියාහුය. ඒ මාරුතය ඉතා චන්ඩ වූයේය. එසේ හෙයින් ඔවුන් හා එක්ව බැඳී සිටියා වූ සල්වනයට පැමිණ ඇත මැත බලා පහරමින් එකරුකකුත් එලන්නට අසමර්ථ විය. බග්න විමානයන් ඇති දෙවියෝ අන් පිළිසරණක් නැතිව දරුවන් ගෙන හිමාලය වනයට ගොස් තමන්ගේ පවත් සල් වනයේ දෙවියන්ට කීවාහුය.

ඒ සල් වනයේ දෙවියෝ මනුෂ්‍යය පථයෙහි දෙවියන් ආනියාව බෝධිසත්වයන්ට කීවාහුය. එබස් ඇසූ මහ බෝසතානෝ නුවනැත්තන්ගේ බස් නොගෙන පිහිටක් නැති තැනට ගියාවූ සත්වයෝ නම් මෙබඳුම වන්නෝ වේ. දැයි කියා ධර්මදේශනා කළාහුය. පින්වත් වූ දේවතාවෙනි ඔහුනවුන් හා එක්ව බැඳී නොසිටි වනයෙහි අට ගත්තා වූ වෘක්ෂයක් මහ පවණින් මුළින් උපුටා හෙලන්නේය. එසේ හෙයින් අචේතස් කවුද සචෙතස් කවුද සියල්ලටම සමගි බව උතුම් වන්නේ යයි මෙසේ මහා බෝසතානෝ මේ කාරණය කියා වෘක්ෂ දේවතාවන්ට අවවාද කොට යවා ආයුෂයාගේ කෙළවර කම් වූ පරිද්දෙන් මිය පරලොව ගියායෝය. ශාස්තෘ වූ බුදු රජානන් වහන්සේ මෙසේ මහරජ දරුවෙනි නෑයන්ට සමගි වීම යහපත් වන්නේය. එසේ හෙයින් සමගි සතුටුව ප්‍රිය සංවාසයෙහි වසවයි මේ ධර්මදේශනාව ගෙණහැර දක්වා වදාරා මේ රුක්ඛ ධර්ම ජාතකය නිමවා වදාළ සේක.

එසමයෙහි දේවතාවෝ නම් දැන් බුදු පිරිසය. නුවණැත් වෘක්ෂ දේවතාවෝ යෙමි තිලෝගුරු සම්‍යක් සම්බුදු රජ වූ මම් ම වේදැයි තමන් වහන්සේ දක්වා වදාළසේක.